දේපල පිරියත හා උපකරණ වලට අදාළ මූලික සංකල්ප විග්‍රහ කිරීම හා ගිණුම්ගත කිරීම

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව දේපල පිරියත උපකරණ නිර්වචනය ·
- පිරිවැය ක්ෂය කළ හැකි අගය ධාරණ වටිනාකම සාධාරණ අගය සුන්බුන් අගය ඵලදායී ජීවකාලය ගිණුම්කරණයට අනුව පැහැදිලි කිරීම·
- හඳුනාගැනීම ප්‍රථම වරට හා පසුකාලීනව පිරිවැය පිළිබඳ සැලකිලිමත් වීම ·
- මිණුම්කරණයේ දී සැලකිය යුතු පිරිවැය මූලිකාංග ·
- ප්‍රථම වරට මිණුම්කරණය කිරීමේදී පිරිවැයට මිනුම් කළ යුතු බවත් පසුව මිනුම්කරනණය කිරීමේදී පිරිවැය ආකෘතියටම හෝ ප්‍රත්‍යාගණන ආකෘතියට මිනුම් කළ යුතු බවත් පැහැදිලි කිරීයි·
- ප්‍රත්‍යාගණන ආකෘතියට ගිණුම් තැබීම·
- ක්ෂය ක්‍රම නම් කර ක්ෂය ගිණුම් තැබීම·
- දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීම ගිණුම් ගත කිරීම·
- දේපල පිරියත හා උපකරණ සම්බන්ධ හෙළිදරව් කිරීම්·

දේපල පිරියත උපකරණ නිර්වචනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව

- නිෂ්පාදනයේ දී හෝ
- සේවා සැපයීමේදී හෝ
- අන් අයට කුලියට දීමේදී හෝ
- පරිපාලන කාර්යයන් සඳහා ලබාගන්නා
- වර්ෂ 1 ට වඩා වැඩි කාලයක් තුලදී භාවිතා කිරීමට අපේක්ෂිත අස්පෘෂ්‍ය වත්කම් දේපල පිරියත උපකරණ ලෙස හැඳින්වේ·

- **පිරිවැය**
  වත්කම් අත්පත් කරකර ගත් අවස්ථාවේදී හෝ අදාළ වත්කම ඉදිකරන අවස්ථාවේ දී එය අත්පත් කර ගැනීම වෙනුවෙන් හෝ ඉදිකිරීම වෙනුවෙන් ගෙවන ලද හෝ ගෙවීමට එකඟ වූ මුදල් හෝ මුදල් සමාන දෑ හෝ දෙන ලද වෙනත් ප්‍රතිෂ්ඨාව ක සාධාරණ වටිනාකම පිරිවැය ලෙස හැඳින්වේ·

- **ක්ෂය කළ හැකිය අගය**
  වත්කමක පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගයෙන් සුන්බුන් වටිනාකම අඩු කළ පසු ලැබෙන අගයක්ෂය කළ හැකි අගය ලෙස හඳුන්වයි
  ක්ෂය කළ හැකි අගය = (පිරිවැය / ප්‍රත්‍යාගණන අගය)– සුන්බුන් අගය
  යන්ත්‍රයට පිරිවැය රු 100 000 ක් වන අතර සුන්බුන් අගය රු 5 000 · මෙම යන්ත්‍රයෙ ක්ෂය කළ හැකි අගය කීයද?
- **ක්ෂය වීම**
  වත්කමක ක්ෂය කළ හැකිය අගය එම වත්කමේ ප්‍රයෝජනවත් ජීවත කාලය පුරා ක්‍රමවත් ලෙස බෙදා හැරීම ක්ෂය වීම ලෙස හඳුන්වයි ·
- **ධාරණ අගය**
  වත්කමික පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි කරනඅලාභය අඩු කළ පසු ලැබෙන අගය වත්කමේ ධාරණ අගයයි· භාවිතයේ දී මෙය ශුද්ධ අගය, ලියා හල අගය, පොත් අගය, ලෙස ද හඳුන්වයි·
- **හානිකරන අලාභ**
  වත්කමක ධාරන අගය ,එහි නැවත අයකර ගත හැකි අගයත් අතර වෙනසයි, නැතහොත් නැවත කරගත හැකි අගය ඉක්මවන ධාරණ අගයයි ·
  හානි කරන අලාභය= නැවත අයකර ගත හැකි අගය – ධාරන අගයි
- **සාධාරණ අගය**
  දැනුම් හා කැමැත්ත ඇති දෙපාර්ශවයක් අතර අතේ දුරින් වන ගනුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගය හෝ වගකීමක් බේරුම් කිරීම සඳහා ගෙවනු ලබන වටිනාකම්යි
- **සුන්බුන් අගය අවශේෂ අගය**
  යම් වත්කමික් ඵලදායී ජීවකාල කාලය අවසානයේ අදාළ වත්කම විකුණා ලබා ගැනීමට අපේක්ෂා කරන ශුද්ධ වටිනාකම සුන්බුන් අගයයි
- **ඵලදායී ජීවකාලය**
  වත්කමක් නියමිත් තත්ත්වයෙන් භාවිතා කිරීමට අපේක්ෂිත කාලය හෝ වත්කමෙන් ලබා ගැනීමට අපේක්ෂිත නිමැවුම් ප්‍රමාණය ලබා ගන්නා කාලය ඵලදා යි ජීව කාලය වේ·

  අපේක්ෂිත කාලය - මෝටර් රථයක් නියමිත තත්ත්වයෙන් භාවිතා කිරීමට අපේක්ෂිත කාලය අවුරුදු 10යි

  අපේක්ෂිත කාලය - ඡායා පිටපත් යන්ත්‍රයෙන් නියමිත තත්ත්වයෙන් ලබාගත් හැකි පිටපත් සංඛ්‍යාව ලක්ෂ 20 සාමාන්‍යයෙන් වර්ෂයකට පිටපත් ලක්ෂ 2 බැගින් ලබා ගන්නේ නම් ඵලදායී ජීවකාලය වන්නේ අවුරුදු 10

ඵලදායී ජීවකාලය කාලය තීරණය කරන සාධක

- භෞතික වැහැරීම
- වත්කමේ ධාරිතාවය
- අපේක්ෂිත භාවිතය
- තාක්ෂණික යල්පැනීම
- නෛතික සීමාවන්

ඉඩමක ඵලදායී ජීවකාලය

ඉඩම් වල ඵලදායී ජීවකාලය සීමාරහිත බැවින් එය ක්ෂය නො කළ යුතු ය· එහෙත් ඉඩමේ අගය කරනු ලබන්නේ මැණික් මිනිරන් වැනි සම්පත් අරමුණු කරගෙන නම් හෝ මුහුද අසල පිහිටි ඉඩමක් වන අවස්ථාවකදී නම් ක්ෂය කිරීම අවශ්‍ය වේ· ඉඩම් ක්ෂය නොකළ ද ඒ දේපළ පිරියත උපකරණ යක් සේ සලකයි·

දේපල පිරියත උපකරණ ක්ෂය කිරීමෙ ක්‍රම

දෙකකි

- සරල මාර්ග ක්ෂය ක්‍රමය
- හීනවන ශේෂ ක්‍රමය

සරල මාර්ග ක්ෂය ක්‍රමය

පිරිවැය - සුන්බුන් අගය
ඵලදායී ජීවකාලය

පිරිවැය × ක්ෂය ප්‍රතිශතය

පිරිවැය - සුන්බුන් අගය × ක්ෂය ප්‍රතිශතය

ක්ෂය ගිණුම් ගත කිරීම

ක්ෂය ගිණුම හර
සමුච්චිත ක්ෂය ගිණුම බැර

දේපල පිරියත උපකරණ හඳුනාගැනීම්

වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගෙන් ඒම සඳහා **දේපල පිරියත උපකරණ හා අයිතමයක පිරිවැය වත්කමක්** ලෙස හඳුනාගත යුතුය ·ඒ සඳහා පහත කොන්දේසි සපුරා ලිය යුතුය ·

එම වත්කම තුළින් අනාගතයේ ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ බව්‍යතාවයක් තිබිය යුතුය

ව්‍යාපාරයක් විසින් අදාළ වත්කම වෙනුවෙන් දරන ලද පිරිවැය විශ්වාසදායි ලෙස මැනියහැකි විය යුතුය

ව්‍යාපාරයක් විසින් සියලු දේපළ පිරියත උපකරණ වලට දරුණු ලබන පිරිවැය ඒවා දරනු ලබන අවස්ථාව අනුව වර්ග 2 කට වෙන් කළ හැක·

- මුල් වරට දන්න ලබන පිරිවැය
- පසුකාලීනව දරන පිරිවැය

<u>මුල්වරට දරන පිරිවැය</u>

දේපල පිරියත හා උපකරණ අත්පත්කරගැනීමට ඉදි කිරීමට හෝ මිලදී ගැනීම්ට මුල්වරට දරන ලද වියදම් වත්කම් සේ සලකා ප්‍රාග්ධනිත කළ යුතුය· මෙම වියදම් අදාල වත්කමේ අපේක්ෂිත භාවිතය දක්වා පත්කරන තෙක් අනිවාර්යෙන්ම දැරිය යුතුය·

දේපල පිරියත උපකරණ පිරිවැයට අගය කිරීමේදී පහත සංරචක අදාල වලට කරගත යුතුය·

1 **ගැනුම් මිල**

ගැනුම් මිල	★★★★
වෙළඳ වට්ටම් සහනාධාර	(★★)
ආයත තීරු ගාස්තු	★★★
ආපසු නොගෙවන බදු	★★
රක්ෂණ ගාස්තු	★★★
නැව් ගාස්තු	<u>★★★</u>

2 **වත්කම් අපේක්ෂිත තත්ත්වයට පත් කිරීමේ පිරිවැය**

ඉදි කිරීමේ පිරිවැය	★★★
වැඩ බිම සකස් කිරීමේ පිරිවැය	★★★
මූලික ප්‍රවාහන හා එහා මෙහා කිරීමේ පිරිවැය	★★★
සවි කිරීමේ හා එකලස් කිරීමේ පිරිවැය	★★★
වටයක් අත්හදා බැලීමේ පිරිවැය	★★★
වෘත්තීය ගාස්තු	<u>★★★</u>

3 **වත්කම් ජීවිත කාලය අවසානයේ ඉවත් කිරීමට දැරිය යුතු යැයි අපේක්ෂිත පිරිවැය** ★★★

පහත් දැක්වෙන්නේ නිෂ්පාදන සමාගමක් විසින් ආනයනය කරන ලද භාණ්ඩයක් පිළිබඳව විස්තරයකි සමාගම VAT ලියා පදිංචි ව්‍යාපාරයකි·

✓ යන්ත්‍රයේ ලකුණු කළ මිල වෙළඳ වට්ටම (10%)	1000
✓ ආනයන තීරු ගාස්තු	200
✓ නිෂ්කාශන ගාස්තු	20
✓ වරායේ සිට ගෙන ඒමේ කුලී	10
✓ යන්ත්‍රය බෑමේ කුලී	5
✓ සවි කිරීමේ හා එකලස් කිරීමේ පිරිවැය	35
✓ ඉංජිනේරු හා වෘත්තීය ගාස්තු	10
✓ පළමු වටය අත්හදා බැලීමේ පිරිවැය	8
✓ පළමු වටයේ නිෂ්පාදනය කරන ලද කොටස් විකිණීමෙන් ලද මුදල	3
✓ යන්ත්‍ර ය මිලදී ගැනීමට අදාල වැට්	90
✓ වෙනත් ස්ථානයක නැවත සවි කිරීමේ වියදම්	10
✓ යන්ත්‍ර නඩත්තුව වියදම්	12

යන්ත්‍රයෙ මුල් වරට හඳුනා ගැනීමේ පිරිවැය ගණනය කරන්න

පහත පිරිවෙන් ගේ ස්ථාවර වත්කම් වල ආරම්භක පිරිවැයට ඇතුළත් වන අයිතම මොනවාද?

A ආනයන බදු හා වෙන්ත් බදු

B පොලී පිරිවැය

C ප්‍රවාහන ගාස්තු

D සවි කිරීමේ පිරිවැය

E විදේශීය උපදේශකවරුන්ගේ පිරි

F අළුත්වැඩියා ගාස්තුව

G අත්හදාබැලීමේ පිරිවැය

පසුකාලීන පිරිවැය

දේපල පිරියත හා උපකරණ අත්පත් කරගත් පසු දරන පිරිවැය දෙයාකාර වේ

- ප්‍රාග්ධන වැය
- අයභාරය වැය

ප්‍රාග්ධන වැය

වත්කමක ප්‍රයෝජනවත් ජීව කාලය,වත්කමේ ධාරිතාවය, නිෂ්පාදන භාණ්ඩ වල ගුණත්වය වැඩි කිරීමට හෝ නිෂ්පාදන පෙරසැරි වියදම අඩු කරලීමට උපකාරී වන නවීකරණයන් හෝ උපාංගයක් සවි කිරීමට දරන ලද වියදම් ප්‍රාග්ධන වැය ලෙස සලකා වත්කම් ගිණුමට හර කළ යුතුය

අයභාර වැය

අදාල වත්කම් නිසි ලෙස පවත්වා ගෙන යා යාමට දරන ලද වැය මේවා ආදායමට එරෙහිව කපා හරිනු ලැබේ *නඩත්තු වියදම් තීන්ත ආලේප කිරීමේ වියදම් වාහනේක අලුත් ටයර් දැමීමේ වියදම්*

LKAS 37 ප්‍රතිපාදනය අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම් සම්බන්ධයෙන් ගිණුම් තැබීම හා හෙළිදරව් කිරීම

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ට අනුව ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් නිර්වචනය කරයි
- ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් අසම්භාව්‍ය වත්කම් වෙන් කර දක්වයි
- ගිණුම්කරණ ප්‍රමිතියට අනුව හඳුනා ගැනීම් හා හෙලිදරව් කිරීම්

ප්‍රතිපාදනයන්

ප්‍රමාණය හෝ කාලය පිළිබඳ අවිනිශ්චිතතාවයක් තියෙන වගකීම් **ප්‍රතිපාදනයක්** වෙයි·

වගකීම් වල ප්‍රමාණය හා කාලය නිශ්චිත ය· එම නිසා ප්‍රතිපාදන වගකීම් වලින් වෙනස් වේ·

එම නිසා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශවල වගකීමක් ලෙස හඳුනා ගත යුතුය·

<u>මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිපාදනයක් ලෙස හඳුනා ගැනීමට තිබිය යුතු නිර්ණායක</u>

- අතීත සිදුවීම් ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ බැඳීමක් තිබීම·
- මෙම බැඳීම් නිරාකරණය කිරීමට ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලා යාමේ හව්‍යතාවයක් ඇති වීම· ·
- බැඳීම් ප්‍රමාණය විශ්වාසදායි ව ඇස්තමේන්තු කළ හැකි වීම·

ඉහත කොන්දේසි සපුරා ලන්නේ නැත්නම් එය ප්‍රතිපාදනයක් ලෙස හඳුනා නොගත යුතුයි

- ✓ EX.... විකුණූ භාණ්ඩ මත වගකීම සහතික වීම මත වෙන් කිරීම
  ලාභ ලාභ ප්‍රකාශය හර (බෙදාහැරීමේ වියදමක්)
  ප්‍රතිඥාහාර සඳහා වෙන් කිරීම් බැර(ජංගම වගකීමකි)

- ✓ කර්මාන්ත ශාලාවක් නිසා පරිසරයට සිදු වූ හානියක් සම්බන්ධයෙන් රජය හෝ වෙනත් ආයතනයක් නඩු පවරා තිබීම
- ✓ සේවයෙන් පහ කරන ලද සේවකයෙකු වන්දි ඉල්ලා නඩු පැවරූ විට වන්දි ගෙවීම් නිශ්චිත හා විශ්වාසදායි ව ඇතස්තමේන්තු කර ඇති විට (නීතිඥයකුවිසින්)

අසම්භාව්‍ය වගකීම්

- ➢ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස පැන නගින·
- ➢ ආයතනය සම්පූර්ණ පාලනයෙන් තොරව·
- ➢ අවිනිශ්චිත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම හෝ සිදු නොවීම මත ඇතිවන බැදීමක් අසම්භව වගකීමක් වේ·

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ බැඳීමක් ඇති වුවද පහත සඳහන් හේතු නිසා වගකීමක් ලෙස හඳුනාගෙන නැති වර්තමාන බැඳීම් අසම්භාව්‍ය වගකීම් වේ

- ▪ එම බැඳීම් පියවීමට ආර්ථික ප්‍රතිලාභ ජනනය කරන සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා යාමේ හව්‍යතාවයක් නැති
  හෝ
- ▪ බැඳීමේ වටිනාකම් විශ්වාසදායී ලෙස මැනිය නොහැකි නිසා හඳුනා නොගන්නා වර්තමාන බැඳීම්කි

උදාහරණ

- ✓ සේවයෙන් පහ කරන ලද සේවකයෙකු වන්දි ඉල්ලා නඩු පැවරීම් වන්දි ගෙවීම් නිශ්චිත නොවීම හා විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කර නැති විට

- ✓ ආයතනයේ අංශයක් වසා දැමීම නිසා ගෙවිය යුතු වන්දි ගෙවීම් නිශ්චිත නොවීම

අසම්භාව්‍ය වත්කම්

- ➢ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාරය පාලනයෙන් බැහැරව
- ➢ අනාගතේ සිදුවිය හැකි යම් සිද්ධියක් සිදුවූවීම හෝ සිදු නොවීම මත පැවැත්ම තහවුරු කරන වත්කම් ය. අසම්භාව්‍ය වත්කම් **මූල්‍යතත්ත්ව ප්‍රකාශයේ** **වත්කමක් ලෙස හඳුනා නොගනී** ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමක් අපේක්ෂා කරන්නේ නම් පමණක් **සටහන්** මගින් හෙළිදරව කළ යුතුයි.

උදාහරණ

ව්‍යාපාරයෙ ඉඩමක් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පවරා ගැනීම වෙනුවෙන් ඉල්ලුම් කළ වන්දි මුදල

හෙළිදරව් කිරීම්

ප්‍රතිපාදනයන්	**අසම්භාව්‍ය වගකීම්කීම්**	**අසම්භාව්‍ය වත්කම්**
කාලච්ඡේදය ආරම්භක හා	මූල්‍ය බලපෑමේ ඇස්තමේන්තුවක්	අසම්භාව්‍ය වත්කම් වල ස්වභාවය
අවසාන ධාරණ වටිනාකම්.		පිළිබඳ කෙටි විස්තරයක
කාලච්ඡේදය තුළ සිදුකරන ලද	සම්පත් ගලායෑම වල් අගය හා	
අතිරේක ප්‍රතිපාදන.	කාල චක්‍ර පිළිබඳ අවිනිශ්චිතතා	ප්‍රායෝගිකව කළ හැකි නම්
		මූල්‍ය බලපෑම් පිළිබඳව
කාලච්ඡේදය තුළ භාවිතයට		ඇස්තමේන්තුවක්
ගත් ප්‍රති ප්‍රතිපාදන.		
භාවිතා නොකර කාලච්ඡේදය		
තුළ ලාභයට එකතු කළ ප්‍රතිපාදන.		

LKAS 8

(ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තු හා වැරදි සම්බන්ධයෙන් ගිණුම් තැබීම හා හෙළි හෙලිදරව් කිරීම්)

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කරන නිශ්චිත

- මූලධර්ම
- පදනම්
- සම්ප්‍රදායන්
- රීතීන්
- පරිචයන් (භාවිතයන්) ගිණුම්කරණ ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ·

උදාහරණ

- ✓ ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය වත්කම් හඳුනා හඳුනාගැනීම්
- ✓ තොගය අගය කිරීමේ ප්‍රතිපත්ති (FIFO/WAC)

ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම

ක්‍රම 2 කි

- ➢ ගිණුම්කරණ ප්‍රමිතියකින් දක්වා ඇත්නම් ප්‍රමිතිය ට අනුව
- ➢ ගිණුම්කරණ ප්‍රමිතයක් නොමැතිනම් කළමණාකරණයේ විනිශ්චය මත ප්‍රතිපත්ති තේරීම්

  - ගණුදෙනු හා සිද්ධීන් සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රමිතියක් නිශ්චිතව අදාළ වන්නේ නම් එම ප්‍රමිතියට අනුව ගිණුම් ප්‍රතිපත්තිය තීරණය කළ යුතුය ·බොහෝ ගනුදෙනු හා සිද්ධීන් සම්බන්ධව අදාල වන හා විශ්වාසනීයව අනාවරණය කරන ලෙස නිර්දේශිත ගිණුම් ප්‍රතිපත්ති ගිණුම් ප්‍රමිත වල දක්වා ඇත ·
    උදාහරණ
    LkAS 2 වෙළඳ තොග සඳහා පිරිවැය සූත්‍ර ලෙස FIFO/WAC දක්වා ඇත·

  - එහෙත් නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ප්‍රමිතයකින් දක්වා නොමැත නම් කළමනාකරණය විනිශ්චය මත **පහත සඳහන් කරුණු සපුරාලන්නේ නම්** සුදුසු ගිණුම්කරණ පතිපත්තියක් අනුගමනය කළ හැක·

1 මූල්‍ය ප්‍රකාශන වල තොරතුරු මේවා පරිශීලනය කරන අයගේ අවශ්‍යතාවයන්ට අදාල වීම

2 මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන කරුණු විශ්වාසනීය ලෙස නිරූපණය වීම

ගිණුම් කරන ප්‍රතිපත්තියක් වෙනස් කළ හැකි අවස්ථා

- ගිණුම්කරණ ප්‍රමිත ක අවශ්‍යතාවය මත
- ආයතනයේ මූල්‍ය තත්ත්වය කාර්ය සාධනය හෝ මූල්‍ය ප්‍රවාහය කෙරෙහි පෙරට වඩා විශ්වාසදායී ලෙස තොරතුරු සැපයීම සඳහා වෙනස් කිරීම් අවශ්‍ය විටෙක

ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම

<u>වත්කම් වගකීම්</u> ආශ්‍රිත අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ හා බැඳීම් වර්තමානයේ දී පවතින තත්ත්වය අනුව තක්සේරු කිරීමේ දී වත්කමක හෝ වගකීමක ධාරණ අගය සඳහා අවශ්‍ය වන ගැලපීම්ක් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීමක් ලෙස හැඳින්වේ

උදාහරණ

- ✓ තොග කපා හැරීම් හා හානිකරන අලාභ සඳහා ඉඩ හැරීම
- ✓ තොග යල් පැනීම
- ✓ මූල්‍ය වත්කම් වල සාධාරණ අගය - කොටස්
- ✓ ක්ෂය කළ හැකි වත්කමේ ඵලදායී ජීව කාලය හෝ ක්ෂය ක්‍රමය වෙනස් කිරීම
- ✓ ප්‍රතිශ්‍රාහාර බැඳීම් සඳහා වෙන් කිරීම්

ඇස්තමේන්තු වෙනස්වීම් වීම් ගිණුම් ගත කරන අයුරු

- වෙනස බලපාන්නෙ වර්තමාන කාලයටපමණක් නම් එම කාලයේදී ලාභය හෝ අලාභයට ගළපන්න

  උදාහරණ තොග කපා හැරීම්

  - හානිකරන අලාභ සඳහා ඉඩ හැරීම
- වෙනස වර්ත වර්තමාන හා ඉදිරි කාලච්ඡේදයට බලපායි නම් එම කාලච්ඡේද වල ලාභයට අලාභයට ගළපන්න

  උදාහරණ ඵලදායී ජීවකාලය වෙනස්වීම්

  - ක්ෂය අනුපාතය වෙනස් කිරීම්
- වත්කම් වගකීම් ස්කන්ධයේ සිදුවන වෙනස සිදුවන කාලච්ඡේදය ධාරණ අගයට ගළපන්න

  උදාහරණ වත්කම් ප්‍රත්‍යාගණනය ලාභ අලාභ

- <u>අභ්‍යාස</u>

2019 පළමු කාර්තුව සඳහා වගකීම් සහ සහතික සඳහා වෙන් කිරීම් විකුණුම් වලින් 2% කි· එහෙත් දෙවන කාර්තුව තුළ දී තීරණය කරනු ලැබුවේ විකුණුම් වලින් 3% ක් දක්වා වැඩි කළ යුතු බවයි · ගිණුම් වර්ෂය 2019·12·31 න් අවසන් වෙයි·

විකුණුම් ආදායම් පළමු කාර්තුව රු 2000 000

දෙවන කාර්තුව රු 3000 000

වගකීම් සහතිකය සඳහා වෙන් කිරීම් ගිණුම් පිළියෙල කරන්න

වැරදි

මූල්‍ය ප්‍රකාශන වල මූලිකාංග

- **හඳුනා හඳුනා ගැනීමේදී**
- **මැනීමේදී**
- **මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී**
- **ඉදිරිපත් කිරීමේදී**
- **අනාවරණය කිරීමේ දී පෙර කාලච්ඡේද එකක හෝ කිහිපයක වැරදි සිදුවිය හැක**

මේ නිසා ලාභදායිත්වය (කාර්යසාධනය) මූල්‍ය තත්ත්වය හා මුදල් ප්‍රවාහය වැරදි ලෙස ඉදිරිපත් වේ·මේවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවේ·මේ නිසා ප්‍රවර්තන වර්ෂයෙ සොයා ගන්නා වැරදි වර්ෂයේදීම මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීමට පෙර ඒවා නිවැරදි කරනු ලැබේ ·

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදලිදරව් කිරීම්

ප්‍රතිපත්ති	**ඇස්තමේන්තු වෙනස්වීම්**	**වැරදි**
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීමේ ස්වභාවය	ඇස්තමේන්තු වෙනස් කිරීමට හේතු	පෙර කාලච්ඡේදය වරදේ ස්වභාවය
අනාගත හා ප්‍රවර්තන කාලච්ඡේද වල සිදුවිය හැකි බලපෑම්	ඇස්තමේන්තු වෙනස් කිරීම් නිසා මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම්	ඉදිරිපත් කර ඇති කරුණට පෙර කාලච්ඡේදය ආරම්භයේ නිවැරදි කිරීම් වැරදි නිවැරදි කර ඇත්තේ කවර කාලයක සිට කෙසේද යන්න පැහැදිලි විස්තරයක්

අභ්‍යාස

1* ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි ගිණුම්කරණ ප්‍රමිති අනුව නිර්වචන ය කරන්න
2* ගිණුම්කරණ ප්‍රතිපත්තියක් තෝරා ගැනීමේදී සලකා බලන මූලික කරුණු දෙක කුමක්ද
3* ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා දෙක ලියන්න
4* ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සටහන් කළ යුතු අන්දම පැහැදිලි කරන්න
5* ප්‍රවර්තන වර්ෂයේ සිදු වූ වැරදි හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීමට පෙර නිවැරදි කළ යුතුය එසේ නම් ඔබ එම වැරදි වල කුමක් හෙළිදරව් කළ යුතුද

LKAS - 10

වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම් සම්බන්ධයෙන් ගිණුම් තැබීම හා හෙළිදරව් කිරීම්

- වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම් ගිණුම්කරණ ප්‍රමිත ට ය ට අනුව නිර්වචනය කිරීම
- ගිණුම්කරණ ප්‍රමිත ය ට අනුව ගලපන සිද්ධි හා නොගලපන සිද්ධි වෙන්කර දැක්වීම
- ගිණුම්කරණ ප්‍රමිති ය ට අනුව හෙළිදරව් කිරීම්

වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන සකස් කරන කාාලච්ඡේදය අවසාන දිනයත් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම්ට අනුමැතිය දෙන දිනයක් අතර කාලච්ඡේදය තුල සිදුවන වාසිදායක හා අවාසිදායක සිද්ධි **වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්** නම් වේ

2019/1/1	2019/12/31	2020/3/15
මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක දිනය	**මූල්‍ය ප්‍රකාශනවල අවසාන දිනය**	**මූල්‍ය ප්‍රකාශන වලට අනුමතිය දුන් දිනය**

උදාහරණ

සීමිත හංසලී පොදු සමාගම 2019/3/31 අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කරයි · අධ්‍යක්ෂවරු විසින් මුල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2019·8·10 වෙනි දින අනුමැතිය ලබා දී ඇත · සියලුම කොටස් කරුවන්ට 2019 ·9.20 දින මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත ·

- ✓ ගිණුම් කාලච්ඡේදය කුමක්ද ?
- ✓ වාර්තා කරන කාලච්ඡේදයෙන් පසු කාලච්ඡේදය කුමක්ද ?
- ✓ වාර්තා කරන කාලච්ඡේදය පසු සිදුවීම් යනු මොනවද ?

වාර්තා කරන කාලච්ඡේදය පසු සිදුවීම්

ගලපන සිදුවීම්

වාර්තා කරන කාලච්ඡේදය අවසාන දිනට **පැවති තත්ත්වය** පිළිබඳ සාක්ෂි සපයන සිදුවීම්

නොගලපන සිදුවීම්

වාර්තා කරන කාලච්ඡේදයට **පසුව** පැන නැගුනු තත්ත්වයන් නරූපනය කරන සිදුවීම්

ගලපන සිදුවීම් හා නොගලපන සිදුවීම් අතර වෙනස වෙනස

ගලපන සිදුවීම්	නොගලපන සිදුවීම්
වාර්තා කරන කාලච්ඡේදය අවසාන දින පැවති තත්වයට සාක්ෂි සපයයි·	වාර්තාකරණ කාලච්ඡේද යෙන් පසු පැන නැගුන තත්ත්වයක් නිරූපණය කරයි· පැවැති තත්ත්වයට සාක්ෂි සපයයි ·
ආදායම් ප්‍රකාශය ටත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ට බලපෑම් කරයි	ආදායම් ප්‍රකාශයට හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට බලපෑම් නොකරයි
මූල්‍ය ප්‍රකාශන තුළ ගැලළපීම් සිදුකළ යුතුය	මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් සිදු නොකරයි
ගැලපුම් සමග හෙළිදරව් කිරීම ද අවශ්‍ය වේ	සටහන් මගින් හෙළිදරව් කළ යුතුය

ගලපන සිද්ධීන්

- 2019·03:31 දිනට සිටින ණයගැතියෙකු මූල්‍ය ප්‍රකාශන අනුමත කරන දිනයට පෙර 2019 ·8.10 බුන්වත් වීම නිසා ගැළපීම් කළ යුතුය

  අඛාල් ණය ගිනුම හර

  ණයගැති පාලන ගිණුම් බැර

- ගිණුම් කාලච්ඡේද තුළ පැවරූ නඩුවක් සඳහා වාර්තා කරන කාලච්ඡේදයෙන් පසු දුන් තීන්දුවක් මත ගෙවීමට සිදුවන වන්දියක් ··

නඩු වන්දි හර

උපචිත වන්දි සඳහා වෙන් කිරීම් බැර

- වාර්තා කරන කච්ඡේදයේ අවසාන දිනට පැවැති තොගයේ පිරිවැයට වඩා මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර අඩු අගයකට විකිණීම

හානි වූ තොග ගිණුම හර

අවසාන තොග ගිණුම බැර

- ගිණුම් කරච්චි ඒ දේ තුළ මිලට ගත් වත්කමක සත්‍ය වටිනාකම් තීරණය වූයේ මූල්‍ය ප්‍රකාශන අනු අනුමත කිරීම්ට පෙර දිනකදී ය

- වාර්තාකරණ කාලච්ඡේදයට පෙර ඉල්ලුම් කරන ලද රක්ෂණ වන්දියක් සඳහා අනුමැතිය ලැබීම හෝ ගෙවීම් කිරීම් කරනු ලැබුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනයෙන් පසුව වුවද ඒවා ගැලපිය යුතුය·

ලැබිය යුතු රක්ෂණ වන්දි හර
ආදායම් ප්‍රකාශය බැර

නොගලපන සිදුවීම්

- වාර්තාකරන දිනයෙන් පසුව තොගයෙන් කොටසක් ගිනි ගත්තේ නම් එය අවසාන තොග ගැලපීම ට අදාල වන්නේ නැත ·
  මෙය සටහන්ක් ලෙස හෙළිදරව් කිරීම් පමණක් සිදු කරයි ·ඊළඟ වර්ෂයේ මේ සඳහා ගැලපීම් කළ යුතුය·
- වාර්තා කරණ කාලච්ඡේද පසු සාමාන්‍ය කොටස් හිමියන්ට ලාභාංශ ප්‍රකාශ කිරීම·
- වාර්තා කරන කාලච්ඡේදයෙන් පසු අනුමත කරන අවසාන දිනයට පෙර සමාගම සතු ආයෝජන වල වෙළඳපල අගය පහල යාම·
- වාර්තාකරන දිනට පසුව ව්‍යාපාරය ප්‍රධාන අංශයක් රජය මගින් පවරා ගැනීම් නිසා සිදුවන අලාභය සටහනක් මගින් ඉදිරිපත් කරයි ·

හෙළිදරව් කළ යුතු කරුණු

- ✓ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම්ට අනුමැතිය ලබා දුන් දිනය
- ✓ එසේ අනුමැතිය දුන් අය කවුරුද යන වග
- ✓ වාර්තා කරන කාලච්ඡේදය අවසානයේ දින පැවති තත්ත්වයන් හෙළි හෙළිදරව් කළ යුතුය
- ✓ වාර්තා කරන කාලච්ඡේදය පසුව සිදු වූ නොගලපන සිදුවීම් වල ස්වභාවය
- ✓ මූල්‍ය බලපෑම් පිළිබඳ ඇස්තමේන්තුවක් හෝ එසේ කළ නො නොහැකි නම් ඒ බව

)